# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2038/18 – 2017 සැප්තැම්බර් 25 වැනි සඳුදා – 2017.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 52ඒ, බෙරගල ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ගංගොඩ ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේඊ/කේජීඑල්/2015/221 හා 2016.04.06 දිනැති ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර 'ඒ' ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0150ක් පමණ වන බෙලිගහමුලවත්ත සහ ගංගොඩවත්ත නමැති ඉඩම් කොටසට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – බෙලිගහමුලවත්ත සහ ගංගොඩවත්ත – **ප්‍රමාණය: හෙක්. 0.0150 ක් පමණ**

උතුරට: ගංගොඩවත්ත සහ බෙලිගහමුලවත්ත; නැගෙනහිරට: බෙලිගහමුලවත්ත; දකුණට: ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ගංගොඩවත්ත.

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/9/2015/ඩබ්ලිව්එස්/151.
2017 අගෝස්තු මස 15 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 262


1A – G26309 – 37 (2017/09)


*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම්, පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, ඒවා ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය, ගයන්ත කරුණාතිලක වන මම මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, කෑගල්ල දිස්ත්‍රික්කයේ, කෑගල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පරණකුරු කෝරළේ සුළු කොට්ඨාසයේ, 53සී වල්දෙනිය ග්‍රාම නිළධාරි කොට්ඨාසයේ, පරගම්මන ගමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක කේ්/කේජීඑල්/2016/377 හා 2017.03.07 දිනැති ප්‍රගමන අනුරේඛනයේ පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුත් ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර 'ඒ' – ඒදණ්ඩේවෙල හෙවත් වේගන්තලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0073**

උතුරට: ඒදණ්ඩේවෙල හෙවත් වේගන්තලේ කුඹුර; නැගෙනහිරට: ඇළ; දකුණට: කාණුව; බටහිරට: මාර්ගය(මා.සං.අ).

02. **කැබලි අක්ෂර 'බී' – ඒදණ්ඩේවෙල හෙවත් වේගන්තලේ කුඹුර – ප්‍රමාණය: හෙක්. 0.0092**

උතුරට: කාණුව; නැගෙනහිරට: ඇළ; දකුණට: ඒදණ්ඩේවෙල හෙවත් වේගන්තලේ කුඹුර; බටහිරට: මාර්ගය(මා.සං.අ.).

ගයන්ත කරුණාතිලක,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍ය.

මගේ අංකය: 4-3/11/2016/යූඩීඒ/336.
2017 ජූලි මස 26 වැනි දින,
ඉඩම් හා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය,
''මිහිකත මැදුර'',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

10 - 263

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.